# බමුණෝ හා යුදෙව්වෝ

බටහිරින් භාරතයට පැමිණි ආර්යයෝ බමුණන්ගේ නායකත්වයෙන් ආර්ය චින්තනය සමග අනාර්ය හෙවත් ප්‍රාග් වෛදික චින්තන මිශ්‍ර කර වෛදික චින්තනය නිර්මාණය කර ඒ මත පදනම් ව දැනුම නිර්මාණය කළහ. මේ චින්තනයෙහි පදනමෙහි වූයේ ආත්මය, ඒක දේවත්වය, ආත්මීය යථාර්ථය, ත්‍රිකෝටික න්‍යාය, ඒකත්වය ආදිය ය. මේ ඇතැම් කරුණු ග්‍රීක යුදෙව් ක්‍රිස්තියානි චින්තනයෙන් වෙනස් බව පැහැදිලි ය. මුළු ලෝකය ම, එනම් විශ්වය ම එකක් විය. වෙන්වීම නැත්නම් වෙන් කිරීම, එසේත් නැත්නම් පෞද්ගලිකත්වය ග්‍රීක යුදෙව් ක්‍රිස්තියානි චින්තනයෙහි වැදගත් වුවක් නමුදු වෛදික චින්තයෙහි එය සලකන ලද්දේ වරදක් ලෙස ය. ඒ වරද කෙතරම්දැයි කිවහොත් එසේ වෙන් වූ පෘථග්ජන සත්ත්වයකුට බ්‍රහ්මන් සමග එකතු වී විමුක්තිය ලබා ගැනීමට නොහැකි විය. පැරණි භාරතීය සමාජය වත්මන් බටහිර සමාජය මෙන් නොව සමූහයක් ලෙස එකට බැඳුණු සමාජයක් විය. ඒකත්වය ආත්මය ලෙස ගත් වෛදික චින්තනයක් තුළ කෙතරම් වෙළෙඳුන් හා සිටුවරුන් සිටිය ද ධනපති ක්‍රමයක් බිහි වීමට ඉඩක් නැත. එදා දඹදිව ඉතා ධනවත් වෙළෙඳුන් හා සිටුවරුන් සිටි බව පැරණි සාහිත්‍යයෙන් අනාවරණය වෙයි. බරණැස හා උදේනි නුවර අතර බඩු පුරවා ගත් ගැල් සිය ගණන් සමග වෙළෙන්දෝ සංචාරය කළහ. එකල උදේනි නුවර පැරණි දකුණු ආසියාවේ විශාලතම නගරය විය. එදා උදේනි නුවරින් පසු දකුණට තිබූ විශාලම නගරය අනුරාධපුරය බව ද අමතක නොකළ යුතු ය. අනුරාධපුරයට ද එකල ලෝකයේ දස අතින් වෙළෙන්දන් පැමිණ ඇති බවටත් රජතුමා ඔවුන්ගෙන් බදු අය කළ බවටත් සාක්ෂි වෙයි.

වෙළෙන්දන් සිටි පමණින් ධනපති ක්‍රමයක් බිහි නොවෙයි. ඒ සඳහා ලෝකයේ ඇති සම්පත් තමන් වෙනුවෙන් මවා ඇතැයි හෝ මැවී ඇතැයි හෝ යන අදහස ද අවශ්‍ය වෙයි. ඒ අදහස ග්‍රීක යුදෙව් ක්‍රිස්තියානි චින්තනයෙහි ඇති නමුත් වෛදික චින්තනයෙහි නොමැත. වෛදික චින්තනයෙහි පුද්ගලයා ලෝකයෙන් වෙන් වීමක් ද නොවීය. සියල්ල බ්‍රහ්මන් වූ කල, බ්‍රහ්මන්ගෙන් කොටසක් තවත් කොටසක් වෙනුවෙන් මැවී ඇතැයි සැලකිය නොහැකි ය. ඒ සියල්ල මායාවන් බවත් මායාව නිසා වෙන් ව පෙනෙන කොටස් අතර තිබිය යුත්තේ සාමූහිකත්වය හා සහජීවනය බවත් වෛදික චින්තනයට එකඟ වෙයි. තමන් විසින් ඉතා පහත් කොට සලකනු ලැබූ ශුද්‍රයන් වුව ද සමස්ත පද්ධතියෙන් වෙන් කිරීමට බමුණන්ට නොහැකි වූයේ මේ චින්තනය හේතුකොටගෙන ය. බ්‍රාහ්මණයන් බ්‍රහ්මන්ගේ මුඛයෙන් උපන් අය ලෙසත් ශුද්‍රයන් බ්‍රහ්මන්ගේ පාදයෙන් උපන්නවුන් ලෙසත් සැලකුණේ ඒ අනුව ය. කෙතරම් පහත් යැයි සැලකුණ ද ශුද්‍රයන් බ්‍රහ්මන්ගේ ඒකත්වයෙන් මුදා වෙනත් තැනක තැබිය නොහැකි විය. එබැවින් ශුද්‍රයන්ට බ්‍රහ්මන්ගේ සිරුරේම පහත්ම තැන ලෙස සලකනු ලැබූ පාදය හිමි විය. ලෝකයේ සම්පත් ගසා කා හැකි පදනමක් වෛදික චින්තනයෙහි නොවී ය.

බ්‍රහ්මන් යුදෙව් දෙවියන් වහන්සේට වඩා වෙනස් විය. බ්‍රහ්මන් යනු ලෝකය මවා ලෝකයෙන් වෙන් වූ දෙවියන් වහන්සේ කෙනෙක් නොවී ය. යුදෙව් දෙවියන් වහන්සේ වූ යෙහෝවා ලෝකය හා සත්වයන් ද මිනිසුන් ද මවා ලෝකයෙන් වෙන් විය. එහෙත් බ්‍රහ්මන් එසේ නොවේ. ලෝකය ද බ්‍රහ්මන් ම විය. බ්‍රහ්මන්ගෙන් වෙන් වූ ලෝකයක් නොවී ය. බ්‍රහ්මන් එක් එක් ස්වරූප ගනියි. ලෝකය මැවීම, ලෝකය පවත්වා ගෙන යෑම, ලෝකය විනාශ කිරීම (නැත්තට ම නැති වන ආකාරයෙන් කෙරෙන ලෝක විනාශයක් නොව නැවත ඇති වීමකට මග පාදන ලෝක විනාශයක් ලෙස) බ්‍රහ්මන්ගේ ආකාර තුනකට භාරවෙයි. මෙයින් ලෝකය පවත්වාගෙන යන ආකාරයට විෂ්ණු දෙවි යන නම ලැබෙයි. ශිව හා ඊශ්වර යනු ලෝකය මැවීමේ දී හා විනාශ කිරීමේ දී බ්‍රහ්මන් ගන්නා ස්වරූප වෙයි. වෛදිකයන්ගේ මැවීම යුදෙව් දෙවියන්ගේ මැවීම මෙන් ඉතිහාසයේ එක්වරක් පමණක් සිදුවන දෙයක් නොවේ. එය නිරන්තරයෙන් සිදුවන මැවිල්ලකි. බ්‍රහ්මන්ගේ ම එක් ස්වරූපයක් වූ විෂ්ණු දෙවියන් විවිධ අවතාර වෙසින් මිනිස් ලෝකයට පැමිණෙන බව භාරතීයයෝ විශ්වාස කරති. මහාභාරතයෙහි සඳහන් වන ක්‍රිෂ්ණ මෙන් ම රාමායනයෙහි රාම ද විෂ්ණුගේ අවතාර වෙති. එපමණක් නොව පසු කාලීන වෛදිකයන්ට අනුව බුදුන් වහන්සේ ද විෂ්ණුගේ අවතාරයකි. විෂ්ණු දෙවියන් පිළිබඳ කතාවෙන් පැහැදිලි වන්නේ බ්‍රහ්මන් ලෝකයෙන් වෙන් නොවන බව ය. එමෙන් ම විවිධ ආගම් හා දර්ශන ද සමස්තයක, එනම් ඒකත්වයක විවිධ ස්වරූප ලෙස සැලකීමක් ද ඉන් පිළිබිඹු වෙයි. වෛදිකයන්ට පටහැණි දහමක් දෙසූ බුදුන් වහන්සේ පවා බ්‍රහ්මන්ගේ ස්වරූපයක් ලෙස ගැනීමට වෛදිකයෝ මැලි නොවූහ. යුදෙව් යෙහෝවා දෙවියන් වහන්සේට වෙනස් ව බ්‍රහ්මන් සංකල්පය එසේ නිර්මාණය වන්නට ඇත්තේ බහු දේව සංකල්ප එක්

© Prof. Nalin De Silva

සංකල්පයක් බවට පත්වීමේදී යැයි සිතිය හැකි ය. බ්‍රහ්මන්ට එතෙක් සිටි සියළු දෙවිවරුන්ගේ ගුණ දීමට සිදු විය. මේ සියළු දෙවිවරුන් එක් දෙවි කෙනකු තුළ එක් කිරීම එක් අයුරකින් කළ හැකි වන්නේ ඒ ඒ දෙවිවරු එක් අයකු බවට පත්වන දෙවියන්ගේ විවිධ ස්වරූප බවට පත් කිරීමෙනි.

සිංහල සංස්කෘතිය තුළ කතරගම දෙවියන් නිර්මාණය කිරීමේ දී ද මෙවැන්නක් සිදු විණි යැයි සිතන්නට හැකි ය. කතරගම දෙවියන් යනු හෙළයන්ගේ, එනම් යක්‍ෂ, නාග, රාක්‍ෂස, දේව ආදීන්ගේ මහසෙන් වැනි එක් දෙවියකු හෝ දෙවියන් කිහිප දෙනකු හා වැදි ජනතාවගේ දෙවියන් හා වෛදික ආර්යයන්ගේ ස්කන්ධ දෙවියන් එකතු වී නිර්මාණය වී ඇති දෙවියන් කෙනකු යැයි සිතීමට ඉඩ ඇත. අද වන විට දෙමළ හින්දු දෙවි කෙනකු වූ මුරුගන් ද එයට එකතු කිරීමේ වෑයමක් වෙයි. මුරුගන් දෙවියන් යනු ස්කන්ධ දෙවියන් නොවේ. විවිධ ආගමිකයන් හා ජන වර්ගිකයන් කතරගම යන්නේ මෙසේ දෙවියන් කිහිප දෙනකු එකතු ව නිර්මාණය වූ කතරගම දෙවියන් තුළ තම තමන්ගේ දෙවියන් සිටින බැව් විශ්වාස කරන බැවින් විය හැකි ය.

මෙහි දී නොකියා ම බැරි දෙයක් වෙයි. සිංහල බෞද්ධයන්ගේ දෙවිවරුන් සිංහලයන්ට ලැබුණේ දෙමළ හින්දූන්ගෙන් යැයි විශ්වාස කරන ඊනියා උගත්තු මෙරට වෙති. මතු පිටින් අතගා බලා කරුණු ඉදිරිපත් කරන මොවුන්ගෙන් ඇතැමෙක් මාක්ස්වාදීහු වෙති. ඔවුන් අතර තම පුතුන්ගේ නම යොදා ගනිමින් පුවත්පත්වලට ලිපි සපයන්නෝ ආදී වශයෙන් විවිධ පුද්ගලයෝ වෙති. සිංහල බෞද්ධයන්ගේ ඇතැම් දෙවිවරු සිංහලයන්ට ලැබී ඇත්තේ යක්‍ෂ නාග ආදී හෙළයන්ගෙනි. තවත් දෙවිවරු වෛදික ආර්යයන්ගෙන් ලැබුණි. විෂ්ණු දෙවියන් මෙන් ම ශිව දෙවියන් ද එසේ වෛදික ආර්යයන්ගෙන් ලැබුණු දෙවි කෙනෙකි. පැරණි සිංහලයන් විෂ්ණු හා ශිව දෙවිවරුන් තම සංස්කෘතිය තුළට අවශෝෂණය කළ ආකාරයට ඊශ්වර දෙවියන් අවශෝෂණය කරගෙන ඇති බවක් නොපෙනෙයි. විෂ්ණු හා ශිව දෙවිවරුන් සිංහල බෞද්ධ සංස්කෘතිය තුළ ඇත්තේ වෛදික විෂ්ණු හා ශිව ලෙස නොවේ. සංස්කෘතියකින් තවත් සංස්කෘතියකට දෙවිවරුන් ද ඇතුළු සංකල්ප අවශෝෂණය වීමේදී වෙනස්වීම්වලට භාජනය වෙයි. සිංහල බෞද්ධයන්ගේ විෂ්ණු යනු බ්‍රහ්මන්ගේ ස්වරූපයක් නොවෙයි.  සිංහල බෞද්ධයන්ගේ විෂ්ණු දෙවියෝ මතු බුදුවෙති. පැරණි සිංහල රජවරුන්ගේ නම්වල සිව ශිව ආදී වශයෙන් සඳහන් වෙයි. මුටසීව රජු එයට හොඳ උදාහරණයකි. මෙය වෛදික ආර්යයන්ගෙන් ලැබුණකි. එමෙන් ම බුදුන් වහන්සේට ද ශිව යන නම යෙදෙයි. ලෝක ශිවංකර යනුවෙන් බුදුන් වහන්සේට යෙදෙන්නේ  වෛදික සංකල්ප අවශෝෂණය කිරීමෙනි.

හින්දු ආගම යනු භාරතයේ පසු කලෙක ඇති වූවකි. හින්දු යන නම භාරතයට යෙදුවේ පසුව එහි පැමිණි මුස්ලිමුන් ය. ඉන්දු ගඟෙන් එතෙර සිට මෙතෙරට පැමිණි මුස්ලිම්වරු භාරතීයයනට හින්දු (ඉන්දු යන්නෙහි විකෘතියකි) යන නම තැබූහ. මේ වන විට වෛදික සංස්කෘතිය විසින් බෞද්ධ හා ජෛන සංකල්ප අවශෝෂණය කර ගනිමින් අවිහිංසාත්මක සංස්කෘතියක් ගොඩ නගාගෙන තිබුණි. පැරණි වෛදික සංස්කෘතිය දෙවියන් උදෙසා සතුන් මරා බිලි දුන් සංස්කෘතියක් විය. ඒ වෛදික සංස්කෘතියට ආර්යයන්ගෙන් ලැබුණු එක් එකතුවක් විය. භාරතයෙහි හින්දු සංස්කෘතිය පැන නැගුණේ සංකරාචාර්යවරයාගෙන් ද පසුව ක්‍රිස්තු වර්ෂ හයසීයේ දී පමණ ය. මුස්ලිමුන් හින්දු යනුවෙන් හැඳින්වූයේ මේ සංස්කෘතියයි. හින්දු සංස්කෘතිය ආගමක් ලෙස නම් කෙරුණේ භාරතයට පැමිණි ඉංගිරිසින් විසිනි. කෙසේ වෙතත් සිංහල බෞද්ධ සංස්කෘතියෙහි දෙවිවරුන් දෙමළ හින්දුගෙන් ලැබුණු බව කීම වැරදි ය. අද පවා සිංහලයන් මුරුගන් දෙවියන් තම දෙවි කෙනකු බවට පත්කරගෙන නැත.මහසෙන්, සමන්, උපුල්වන් ආදී සිංහල බෞද්ධ වූ හෙළ දෙවිවරුන්ට අමතර ව  සිව, විෂ්ණු, ගණ, නාථ, පත්තිනි ආදී දෙවිවරු සිංහල බෞද්ධ වූ වෛදික ආර්ය දෙවිවරුන් බවත් ඔවුන් සිංහල බෞද්ධ සංස්කෘතියෙන් පිටමන් කිරීම ද අහිතකර ප්‍රතිඵල දෙන ක්‍රියාවක් බවත් කිව යුතු ය.  සිංහල බෞද්ධයන් දේව නිර්මාණයක් විශ්වාස නොකළ පමණින් ඔවුන්ට දෙවිවරුන් නොසිටිය යුතු නොවේ. දෙවියන්ගේ කාර්යය කුමක්දැයි සිංහල බෞද්ධයෝ අවුරුදු දෙදහස් තුන්සීයකට වැඩි කාලයක් තිස්සේ තේරුම් ගෙන සිටියහ. බටහිර හේතුවාදයට යට වී බුදු දහම කසිකබල් හේතුවාදයක් (රැෂනිලිසම්) කර (බුදු දහම හේතුවාදයක් නොව හේතුඵල වාදයකි) සිංහල බෞද්ධ දෙවියන් සිංහල සංස්කෘතියෙන් පන්නා දැමීමට කටයුතු කිරීම සමහර විට බටහිර යටත්විජිතවාදී ඒජන්තයන්ගේ ක්‍රියාවක් විය හැකි ය.

වෛදික චින්තනයෙහි තිබූ ඒකත්වයට අමතර ව එය ග්‍රීක යුදෙව් ක්‍රිස්තියානි චින්තනයෙන් වෙනස්වන තවත් බොහෝ ලක්‍ෂණ වෙයි. ඉන් එකක් නම් යථාර්ථයයි. වෛදික චින්තනය ආත්මීය යථාර්ථවාදී වන අතර ග්‍රීක යුදෙව් ක්‍රිස්තියානි

© Prof. Nalin De Silva

චින්තනය වාස්තවික යථාර්ථවාදී වෙයි. යථාර්ථය යනු පවත්නා දෙයකි. ඕනෑම යථාර්ථවාදයක් ආත්මවාදී වෙයි. යමක් ඇතැයි යථාර්ථවාදීහු විශ්වාස කරති. පුටු, මේස, අම්ල, භෂ්ම, ගුරුත්වාකර්ෂණය, ගස් ගල් ආදිය පවත්නා දේ යැයි යථාර්ථවාදීහු විශ්වාස කරති. වාස්තවික යථාර්ථවාදීන් ආත්මීය යථාර්ථවාදීන්ගෙන් වෙනස් වන්නේ මෙය කෙසේ පවතින්නේදැයි නිර්ණය කිරීමෙහි දී ය. වාස්තවික යථාර්ථවාදීන්ට අනුව යථාර්ථය මිනිසාගෙන් හෝ වෙනත් අයකුගෙන් හෝ තොරව පවතියි. මිනිසාගේ  හෝ වෙනත් අයකුගේ මනස තිබුණත් නැතත් යථාර්ථය පවතියි. මිනිසා සිටියත් නැතත් මිනිසාගේ මනස තිබුණත් නැතත් පොළොව ඉර වටා යයි. පොල් ගෙඩි පොළොවට වැටෙයි. අම්ල භෂ්ම සංයෝගයෙන් ලවණ තැනෙයි. බටහිර විද්‍යාව මේ චින්තනය මත පදනම් වෙයි. බටහිර විද්‍යාඥයන්ට අනුව මේ යථාර්ථය පවතිනවාක් පමණක් නොව යථාර්ථය දැන ගැනීමට ද හැකිවෙයි. බටහිර විද්‍යාව මේ යථාර්ථය දැන ගැනීමට උත්සාහ කරන බවත් තමන් ඒ යථාර්ථය පිළිබඳ දැනුම කරා ක්‍රමයෙන් යන බවත් බටහිර විද්‍යාඥයෝ විශ්වාස කරති. කල්ගත වී හෝ ඒ යථාර්ථය බටහිර විද්‍යාව විසින් දැන ගනු ලබන බව බටහිරයන්ට විශ්වාස ය. වාස්තවික යථාර්ථයක් පිළිබඳ වූ එවැනි අදහසක් ග්‍රීක යුදෙව් ක්‍රිස්තියානි චින්තනය තුළ නොතිබෙන්නට බටහිර විද්‍යාවක් ඒ චින්තනය පදනම් කර ගනිමින් බටහිර සංස්කෘතිය තුළ බිහි නොවනු ඇත.

ආත්මීය යථාර්ථවාදීන්ට අනුව යථාර්ථයක් තිබුණ ද එය වාස්තවික නොවේ. යථාර්ථය ඇත්තේ මිනිසාගේ හෝ බොහෝ විට වෙනත් අයකුගේ මනසෙහි ය. යථාර්ථය යනු ඒ මනස ය. මනස විඥානය ආදී කිනම් නමකින් හැඳින්වුව ද, ඒ මනස හා මනස පමණක් යථාර්ථය වෙයි. වෛදික චින්තනයහි බ්‍රහ්මන්, එනම් බ්‍රහ්මන්ගේ විඥානය පමණක් යථාර්ථය වෙයි. සියල්ල බ්‍රහ්මන්ගේ නිර්මාණ වෙයි. මිනිසුන් ඇතුළු අනෙක් සතුන්ගේ මනස්වල කුඩා ලෝක නිර්මාණය වෙයි. ඒ යථාර්ථය නොවෙයි. ඒ මායාවන් වෙයි. මායාවන් නොවන නිර්මාණය බ්‍රහ්මන් නිර්මාණය වෙයි. ඒ යථාර්ථය තේරුම් ගැනීමට අනෙක් සතුන් බ්‍රහ්මන් හා එක් විය යුතු ය. එවැනි ආත්මීය යථාර්ථයක් පදනම් කරගත් වෛදික චින්තනය තුළ බිහි වූ දැනුම වාස්තවික යථාර්ථයක් මත පදනම් වී පහළොස්වැනි සියවසේ පමණ සිට බටහිර බිහිවන දැනුමෙන් වෙනස් වීම පුදුමයට කරුණක් නොවිය යුතු ය.

**මහාචාර්ය නලින් ද සිල්වා**

© Prof. Nalin De Silva